# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,මහලේකම් කාර්යාලය, තැ.පෙ.1559, කොළඹ 01, ශ්‍රී ලංකාව.
நிதி திட்டமிடல் அமைச்சு, செயலகம், தபெ. 1559, கொழும்பு 01, இலங்கை
Ministry of Finance & Planning, The Secretariat, P.O.Box: 1559, Colombo 01. Sri Lanka.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம்; / Director General } 0094112484729 dgto@tod.treasury.gov.lk
ෆැක්ස් / பெக்ஸ் / Fax } 0094 112 484970
පොදු / பொது / General } 0094 112 484500 0094 112 484600


මගේ අංකය / எனது இல / My No. } TO/DCM/CLOCB/2013
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதி / Date } 2013-11- 18

හාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 04/2013

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

**<u>2013 වසර සඳහා මුදල් පොත පියවීම සහ අග්‍රිම ගිණුම් පියවීම</u>**

2013 වර්ෂය අවසානයේ මුදල් පොත පියවීම සහ අග්‍රිම ගිණුම් පියවීම සඳහා මෙහි පහත සඳහන් පියවරයන් අනුගමනය කර, එම නිශ්චිත දිනට හෝ එදිනට පෙර අදාල කටයුතු සංවිධානය කර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

1. **2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොත් පියවීම**

   2013 වර්ෂයේ මුදල් පොත්, 2013 දෙසැම්බර් 31 දිනය අවසානයේ පහත සඳහන් ආකාරයට පියවිය යුතුය.

   අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් තම කාර්යාල සහ උප කාර්යාලවල ගිණුම් පියවීම පිණිස වගකිව යුතු මාණ්ඩලික නිලධාරියෙකුට අදාල නිලධාරියාගේ නමින්ම බලය පැවරිය යුතු අතර, එම ලිපියේ පිටපතක් විගණකාධිපති වෙත යැවිය යුතුය. එසේ බලය පවරන ලද නිලධාරියා විසින් 2013 වර්ෂය සඳහා වූ මූල්‍යමය ගණුදෙනු 2013 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතු අතර, එදිනට පසු කිසිම මූල්‍යමය ගණුදෙනුවක් 2013 වර්ෂය වෙනුවෙන් සිදු නොකළ යුතුය. තවද එම නිලධාරියා විසින් සිගාස් වැඩසටහනට සමගාමීව තවදුරටත් මුදල් පොත් භාවිතා කරන කාර්යාල තුල 2013 දෙසැම්බර් 31 දිනට පසු කිසිදු මූල්‍යමය ගණුදෙනුවක් 2013 වර්ෂයට අදාල මුදල් පොත්වල සටහන් කළ නොහැකි වන සේ, එක් එක් මුදල් පොත්වල එදිනට සටහන් කෙරෙන අවසාන සටහනට යටින් රතු තීන්තෙන් ඉරක් ඇඳ, 2013 වර්ෂයේ මුදල් පොත් පියවා තම නම, අත්සන, තනතුර, දිනය සහ වේලාව සහිත සටහනක් තැබිය යුතුය.

2. **<u>අක් මුදල් ගිණුම (7002) පියවීම සඳහා වර්ෂය අවසානයේ මුදල් පොත් ශේෂය මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම</u>**

   2.1. අමාත්‍යාංශ සහ උපකාර්යාල රහිත දෙපාර්තමේන්තු විසින් 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය සඳහන් කරමින් ආකෘති අංක:ටිඕඩි/අයිඑම්පී/06 සම්පූර්ණ කර, 2014 ජනවාරි 01 දින ඔබගේ නිල බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛාවට භාර දිය යුතු අතර, බැංකුවෙන් ඔබ වෙත ලැබෙන “භර” නිවේදනයේ සහතික කරන ලද පිටපත සහ ආකෘති අංක:ටිඕඩි/අයිඑම්පී/06 හි පිටපත නොපමාව මෙම දෙපාර්තමේන්තුවට ලැබෙන සේ එවිය යුතුය.

   2.2. අමාත්‍යාංශ සහ උපකාර්යාල සහිත දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය සඳහන් කරමින් ආකෘති අංක:ටිඕඩි/අයිඑම්පී/06

සම්පූර්ණ කර 2014 ජනවාරි 02 දින හෝ ඊට පෙර අදාල බැංකු ශාඛාවට භාර දිය යුතු අතර, බැංකුවෙන් ලැබෙන "හර" නිවේදනයේ සහතික කරන ලද පිටපත සහ ආකෘති අංක:ටිඕඩී/අයිඑම්පී/06 හි පිටපත නොපමාව මෙම දෙපාර්තමේන්තුවට ලැබෙන සේ එවිය යුතුය.

2.3. මෙම දෙපාර්තමේන්තුව විසින් 2014 ජනවාරි මාසයේ වැඩ කරන පළමු දින තුලදී 2014 වර්ෂය සඳහා අග්‍රිම නිදහස් කිරීමට කටයුතු කරනු ලබන බැවින් කිසිදු අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් 2013 වර්ෂයේ අග්‍රිම ශේෂයන්ගෙන් කිසිදු කොටසක් රඳවා ගත යුතු නොවේ. වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂයක් නොමැති වූවද, ඒ බැව් සඳහන් හිස් වාර්තාවක් නොපමාව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුවේ.

2.4. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා 2014 වර්ෂය වෙනුවෙන් ප්‍රථම අග්‍රිම නිකුත් කිරීමෙන් පසුව අග්‍රිම නිකුත් කරනු ලබන්නේ ඉහත 2.1, 2.2 සහ 2.3 ඡේදයන්හි සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමෙන් අනතුරුව බව ද කාරුණිකව සලකන්න.

2.5. උප කාර්යාල වෙත ලබා දී ඇති අතුරු අග්‍රිම සහ නිලධාරින් වෙත ලබා දී ඇති අනෙකුත් අග්‍රිමද, 2014 ජනවාරි මස 01 වන දිනට භාණ්ඩාගාරයට පියවීමට හැකිවන පරිදි අවශ්‍ය පූර්ව විධි විධාන යොදා ගත යුතුය. ඔබ විසින් උප කාර්යාල වලින් 2013 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය ගෙන්වා ගැනීමේදී අදාල බැංකු ශාඛාව සමඟ සාකච්ඡා කොට ඉහත 2.1. පරිදි වූ පහසු ක්‍රමයක් අනුගමනය කිරීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3. <u>ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර අග්‍රිම ගිණුම පියවීම - අග්‍රිම ගිණුම් අංක 7003</u>

3.1. ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශාධාර සඳහා 7003/0/0/../13 සංකේත අංකය යටතේ, ව්‍යාපෘති විසින් ලබා ගත් අග්‍රිමයෙන්, 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය තහවුරු කරමින් ආකෘති අංක:ටිඕඩී/අයිඑම්පී/07 නිසිපරිදි සම්පූර්ණ කර 2014 ජනවාරි 01 දින ඔබගේ බැංකු ශාඛාවට භාර දිය යුතු අතර බැංකුවෙන් ඔබ වෙත ලැබෙන "හර" නිවේදනයේ සහතික කරන ලද පිටපත සහ ආකෘති අංක:ටිඕඩී/අයිඑම්පී/07 සහ ටිඕඩී/අයිඑම්පී/07(i) නිවැරදිව සම්පූර්ණ කර අදාල අමාත්‍යාංශයට පිටපතක් සහිතව නොපමාව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

3.2. ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර යටතේ ලබා දී ඇති අග්‍රිම හැර වෙනත් කිසිදු ලැබීමක් 7003 අග්‍රිම සංකේතය යටතේ ගිණුම් ගත කළ නොහැකි වන බැවින්, වෙනත් ලැබීම් මෙම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට(ටිඕඩී/අයිඑම්පී/07(i)) ඇතුළත් නොකළ යුතු අතර, එවැනි ලැබීම් 7002 අග්‍රිම ගිණුම් අංකය යටතේ ගිණුම් ගත කළ යුතුවේ.

4. පෙර වර්ෂ වෙනුවෙන් පියවිය යුතුව ඇති යම් හිඟ අග්‍රිම ශේෂයක් වේනම්, ඒවා නොපියවීම හෝ ගිණුම් කටයුතුවලට අදාලව මෙම දෙපාර්තමේන්තුවට සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට නියමිත දිනයන් ට ඉදිරිපත් කළ යුතු වන වාර්තා නිසි කලට ඉදිරිපත් නොකිරීම හෝ මෙම චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූල නොවීම, භාණ්ඩාගාරය විසින් එම ආයතනයට අග්‍රිම නිකුත් කිරීම තාවකාලිකව නතර කරනු ලැබීමට හේතු වනු ඇත.

5. <u>මෙම කරුණු සම්බන්ධව තවදුරටත් පැහැදිලි කිරීම් ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් , ඒ සඳහා පහත නම් සඳහන් නිලධාරින් ඇමතිය හැක.</u>

| <u>මාණ්ඩලික නිලධාරියාගේ නම සහ තනතුර</u> | <u>අංශය</u> | <u>දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය</u> |
|---|---|---|
| එච්.සී. දිලිප් සිල්වා<br>අධ්‍යක්ෂ | ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ | 011-2484994<br>dilipl@tod.treasury.gov.lk |

| | | |
|---|---|---|
| ජී. සරත් කුමාර මහතා<br>අධ්‍යක්ෂ | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශාධාර | 011-2484751<br>sarathk@tod.treasury.gov.lk |
| එන්.පී. අනූජා ජයවර්ධන මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂිකා | රාජ්‍ය සේවා | 011-2484744<br>anujaj@tod.treasury.gov.lk |
| එස්.ඩබ්. මදනායක මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | ආරක්ෂාව සහ නීතිය බලාත්මක කිරීම | 011-2484739<br>sumedhaw@tod.treasury.gov.lk |
| අයි. තමරා ඉලංගමුදලි මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂිකා | මානව සම්පත්, පර්යේෂණ සහ තාක්ෂණය | 011-2484740<br>thamarai@tod.treasury.gov.lk |
| එම්.ඩී.එන්. සමදරා ජයරත්න මෙනවිය<br>සහකාර අධ්‍යක්ෂිකා | මූර්ත ආර්ථිකය සහ මූල්‍ය | 011-2484742<br>samadaraj@tod.treasury.gov.lk |
| එච්.ඩී. හිමාලි විජේතුංග මිය<br>සහකාර අධ්‍යක්ෂිකා | යටිතල පහසුකම්, සමාජ ආරක්ෂණය සහ පරිසර | 011-2484743<br>himalic@tod.treasury.gov.lk |

එම්.එස්.ඩී.රණසිරි
අධ්‍යක්ෂ ජනරාල්,
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පිටපත් -

1. විගණකාධිපති
2. රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
3. ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් - කරුණාකර ඉහත 3.1 අනුව කටයුතු කිරීම සඳහා
4. මහා කළමණාකරු - ලංකා බැංකුව
5. සාමාන්‍යාධිකාරි- මහජන බැංකුව

(4, 5) } ඉහත 2.1, 2.2 සහ 3.1 යටතේ සඳහන් කර ඇති පරිදි මුදල් ප්‍රේෂණය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා

ආකෘති අංකය : TOD/IMP/06

මගේ අංකය :- ..................................

දිනය :- ..................................

කළමනාකරු,
ලංකා බැංකුව/ මහජන බැංකුව,
.................. ශාඛාව.

මහත්මයාණෙනි/මහත්මියනි,

**20.. .12. 31 දිනට මුදල් පොත පියවා**
**ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම**
**ජංගම ගිණුම් අංක . . . . . . . .. . . . . . . . .**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :- .................................................

අග්‍රිම ගිණුම් අංකය :- **7002/0/0/. . . . . . . /..**

20.. .12.31 දිනට මෙම *අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුදල් පොතට අනුව "හර" ශේෂය වන රු. ............................................... ක මුදල *ලංකා බැංකුවේ තැපැල් ශාඛාවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් අංක 2026450 / *මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් අංක 014-1-001-3-0110432 ගිණුමේ "බැරට" ප්‍රේෂණය කර මා වෙත "හර" නිවේදනයක් නිකුත් කරන්න.

මෙයට,
විශ්වාසී,

ගණකාධිකාරී/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට

දිනය :- .20.../..../.....

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මුදල්)
අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට

දිනය :- .20.../..../.....

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව,
ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ අංශය,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

} කරුණාකර ඉහත සඳහන් මුදල් පොතේ ශේෂය අග්‍රිම ගිණුම් අංක 7002/0/0/. . . ./.. ට බැර කරන්න.

* අදාල නොවන කොටස් කපා හරින්න.

ආකෘති අංකය : TOD/IMP/07

මගේ අංකය :- ..................................

දිනය :- ..................................

කළමනාකරු,
ලංකා බැංකුව/ මහජන බැංකුව
.................. ශාඛාව.

මහත්මයාණෙනි/මහත්මියනි,

**<u>20.. .12.31 දිනට ප්‍රතිපූර්ණය කල හැකි විදේශාධාර වෙනුවෙන් වූ මුදල් පොත පියවා</u>**
**ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම**
**ජංගම ගිණුම් අංක . . . . . . . . . . . . .**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :- ............................................................
ව්‍යාපෘතිය :- ............................................................

අග්‍රිම ගිණුම් අංකය :- **7003/0/0/. . . . . . . /..**

20.. .12.31 දිනට ..............................................................................................ව්‍යාපෘතියේ මුදල් පොතට අනුව "හර" ශේෂය වන රු. ............................................. ක මුදල *ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් අංක 2026450 / *මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් අංක 014-1-001-3-0110432 ගිණුමේ "බැරට" ප්‍රේෂණය කර මා වෙත "හර" නිවේදනයක් නිකුත් කරන්න.

මෙයට,
විශ්වාසී,

| | |
|---|---|
| මූල්‍ය කළමනාකරු/ව්‍යාපෘති ගණකාධිකාරී<br>ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙනුවට | ව්‍යාපෘති අධ්‍යක්ෂ<br>අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට |
| දිනය :- .20.../..../..... | දිනය :- .20.../..../..... |

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්
විදේශාධාර කළමනාකරණ අංශය,
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.
} කරුණාකර ඉහත සඳහන් මුදල් පොතේ ශේෂය අග්‍රිම ගිණුම් අංක 7003/0/0/. . . ./.. ට බැර කරන්න.

අමාත්‍යාංශ ලේකම් - දැනගැනීම සඳහා

* අදාල නොවන කොටස් කපා හරින්න.

ආකෘති අංකය : TOD/IMP/07(i)

## 20....-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අත් මුදල් සැසඳුම් ප්‍රකාශය
### ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර

1. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :- ……………………………………

2. අග්‍රිම ගිණුම් අංකය :- ……………………………………

3. ව්‍යාපෘතිය :- ……………………………………

| මාසය; | ලබාගත් අග්‍රිම (රු.) | | | වියදම (රු.) | | | ශේෂය (රු.) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | RFA (1) | DF (2) | එකතුව (1)+(2)=(3) | RFA (4) | DF (5) | එකතුව (4)+(5)=(6) | RFA (1-4) | DF (2-5) | එකතුව (3-6) |
| ජනවාරි | | | | | | | | | |
| පෙබරවාරි | | | | | | | | | |
| මාර්තු | | | | | | | | | |
| අප්‍රේල් | | | | | | | | | |
| මැයි | | | | | | | | | |
| ජූනි | | | | | | | | | |
| ජූලි | | | | | | | | | |
| අගෝස්තු | | | | | | | | | |
| සැප්තැම්බර් | | | | | | | | | |
| ඔක්තෝබර් | | | | | | | | | |
| නොවැම්බර් | | | | | | | | | |
| දෙසැම්බර් | | | | | | | | | |
| එකතුව | | | XX | | | XX | | | XXX |

වර්ෂය තුළ ලබා ගත් මුළු අග්‍රිමය (3) :- XX

වර්ෂයේ මුළු වියදම (6) :- XX

20… .12.31 දිනට ශේෂය :- XXX

<u>නොපියවූ අත්තිකාරම්; (තිබේ නම්;)</u>

| ගෙවූ දිනය | ආයතනය | හේතුව | මුදල - රු. ශත. |
|---|---|---|---|
| ……….. | …………………………….. | …………………… | X |
| ……….. | …………………………….. | …………………… | X |
| | | | XX |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

…………………………………………

මූල්‍ය කළමණාකරු/ව්‍යාපෘති ගණකාධිකාරී

දිනය : …………………………